**කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභාව**

**-------------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු උතුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විගණනය සඳහා ගෙවිය යුතු රු.13,000 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිපාදන සලසා නොතිබිණ.

(ආ) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා දරන ලද රු.3,208,980 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන කාර්යය යටතේ සඳහන් කල යුතු නමුත්, මෙහෙයුම් කටයුතු යටතේ සටහන් කර තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොතිබීම

**-------------------------------------**

මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 81,562,259 | ඉඩම් හිමිකම් ඔප්පු |
| (ii) | යන්ත්‍රෝපකරණ | 786,500 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iii) | ලී බඩු හා උපකරණ | 1,123,129 | |

#### 1.3.3 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම

**----------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති රීති යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | පරිගණක 13 ක්, පරිගණක උපාංග සහ මෘදුකාංග සටහන් කිරීම සඳහා වෙනම පරිගණක ලේඛනයක් නොතිබුණි. |
| (ආ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) 1 පරිච්ඡේදයේ 5(12) රීති | මුදල් සහ ගබඩා වගකීම් රාජකාරි මට්ටමෙන් නිලධාරීන් තුන් දෙනෙකුට භාරදී ඇතත් එම අයගෙන් සුරැකුම් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 193 රීති | සමාලෝචිත වර්ෂයේදී තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් අදාල විස්තර අයවැය ලේඛනය සමඟ සසදා බලා විෂමතා සම්බන්ධයෙන් පාදක වූ හේතු විස්තර ඇතුළත් කොට ප්‍රකාශයක් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,944,988 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2, 415,575 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,529,413 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) සන්නිවේදන කුළුණු වෙනුවෙන් ගාස්තු අය කිරීම**

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සන්නිවේදන කුළුණු 10 ක් ඉදි කර ඇති නමුදු ඒවායින් හතරකට 2009 වර්ෂයේ සිට ඉදි කිරීම් ගාස්තු සහ වාර්ෂික හිමිකම් යනාදිය සඳහා රු. 180 ,000 ක මුදලක් අය කර නොතිබුණි.

**(ආ) වරිපනම් සහ බදු**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශිය සභා බලතල පනතේ 134 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් නිවාස සහ ගොඩනැගිලි සඳහා වරිපනම් ගාස්තු අය කිරීමට සභාව විසින් කටයුතු නොතළ බැවින් ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන ආදායම් කාරකය වන මෙම බදුවලින් ලැබිය යුතු ආදායම අහිමි වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

2005 - 2006 කාල වකවානුව තුළ ප්‍රධාන ලේකම් නැගෙනහිර පළාත, ප්‍රාදේශිය පළාත් පාලන කාර්යාලය සහ පළාත් සභා , පළාත් පාලන අමාත්‍යාංශය වැනි ආයතන මගින් පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ලද මෝටර් රථ 13 ක හිමිකම් සභාවේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **වාහන පාවිච්චිය**

--------------------

සභාව විසින් පාවිච්චි කරනු ලබන වාහන 18 වේ රාජ්‍ය ලාංඡනය සලකුණු කළ යුතු නමුත් එසේවුවද සලකුණු කර නොතිබුණි.

**3.3** **සභාවට අයත් නිෂ්ක්‍රීය වත්කම්**

----------------------------------

2001 වර්ෂයේ දී නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමාගෙන් ලබා ගන්නා ලද රු.3000,000 ක් වටිනා ට්‍රැක්ටරය සහ 2005 වර්ෂයේදී ලබා ගන්නා ලද ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියා කොට පාවිච්චියට ගැනීමට හෝ ඒවා වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි.

**4.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) අභ්‍යන්තර පාලනය